www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්ධන මිල නියම කිරීම මත ශ්‍රී ලංකා ආන්ඩුව සහ උපරිමාධිකරනය ගැටෙති

## Sri Lankan government and Supreme Court clash over fuel pricing

**විජේ ඩයස් විසිනි**
**2008 දෙසැම්බර් 23**

ශ්‍රී ලංකා උපරිමාධිකරනය විසින් පෙට්‍රල් මිල අඩු කිරීම සම්බන්ධව දෙසැම්බර් 17 දෙන ලද තීන්දුව ආන්ඩුව සමග ගැටුමක් නිර්මානය වීමට තුඩු දී ඇත. උසාවි තීන්දු ක්‍රියාවට දැමීමේ අවසන් දිනය පසු වී දින ගනනක් ගත වී ඇතත් රජයට අයත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් අලෙවි කරනු ලබන ඉන්ධන මිල පහත හෙලීමට අමාත්‍යමන්ඩලය අසමත් වී තිබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස අවුල තවදුරටත් දිග් ගැස්සෙමින් ඇත. උපරිමාධිකරනයේ නියෝගයට අදාලව ඛනිජ තෙල් සංස්ථාවේ එකම තරගකරු වන ලංකා ඉන්දියානු තෙල් සංස්ථාව පෙට්‍රල් ලීටරයක මිල රුපියල් සියය දක්වා අඩු කිරීමට පසුගිය සිකුරාදා එකඟ විය. පාඩුවට විකිනීමට සිදුවනු ඇතැයි සිතන නිසා බෙදා හරින්නන් ඉන්ධන මිලදී ගැනීමට අකමැතිව සිටීමත් මිල පිලිබඳ අවිනිශ්තභාවයත් නිසා ඛනිජ තෙල් සංස්ථාවට අයත් බොහෝ ඉන්ධන පිරවුම්හල් වසා ඇත.

සමහර ප්‍රදේශවල එල්. අයි. ඕ. සී පිරවුම් හල් වාහනකරුවන්ගෙන් පිරී ඇතත් සෙසු ප්‍රදේශවල ඉන්ධන නැත.

ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරු පසුගිය සතියේ කිහිපවරක් රැස් වූ නමුත් උසාවියේ ලිඛිත නියෝගය තමන්ට නිලවශයෙන් නොලැබුන බවට පල්ල ගිය නිදහසට කරුනු ඉදිරිපත් කිරීමක් මගින් ඉන්ධන මිල පිලිබඳ තීන්දුවක් ගැනීම කල් තැබූහ. මෙම කල්මැරීමේ ඇත්ත හේතුව බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව වියදම් සහගත යුද්ධය දිග් ගැස්සෙන තතු යටතේ ආන්ඩුව බරපතල මූල්‍ය අර්බුදයකට මුහුනපා සිටීම ය. මහාභාන්ඩාගාරය පසුගිය කාලය තුල ඉන්ධන බදුවලින් විශාල ලාභයක් උපයාගෙන ඇත.

උසාවි තීන්දුවට හේතුකාරක වූයේ ඉන්ධන මිල වේගයෙන් ඉහල යනවිට ඛනිජ තෙල් සංස්ථාව විසින් අත්සන් කල විනාශකාරී හෙජින් ගිවිසුම ය. චාර්ටඩ් බැංකුව, සිටි බැංකුව, ඩොයිස් බැංකුව සහ දේශීය බැංකු දෙකක් සමග අත්සන් කල ගිවිසුමට අනුව තෙල් බැරලයක මිල ඩොලර් 100 ත් 135 අතර මිල ඉහල නැගුන ඕනෑම අවස්ථාවක මාසයකට ඩොලර් බිලියන 1.5 ක උපරිමයක් දක්වා ගිවිසගත් මුදලක් බැංකු විසින් ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතුය. එහෙත් මෙම හෙජින් ගිවිසුම අතිශයින්ම අන්තරායකාරී විය: තෙල් බැරලයක මිල ඩොලර් 100 වඩා අඩු වූ විට ඛනිජ තෙල් සංස්ථාව බැංකුවලට සීමාවකින් තොරව ගෙවිය යුතුය.

තෙල්මිල පහත වැටීමත් සමග බැංකුවලට ඩොලර් මිලියන 300 ගෙවීමට සංස්ථාවට සිදු වූ බව තෙල් සංස්ථාවේ සභාපති අසන්ත ද මැල් පිලිගත්තේ ය. හෙජින් ගිවිසුම පිලිබඳ ප්‍රවෘත්ති එකිනෙකාට දෝෂාරෝපනය කිරීමේ, විවේචන සහ දූෂන පිලිබඳ චෝදනාවන් සහිත එකිනෙකාට බැනවැදීමක් බවට පත් විය. අමාත්‍ය මන්ඩලය විසින් ගිවිසුම අනුමත කල බවත් එහි පවතින අන්තරායකාරී ස්වභාවය ගැන තෙල් සංස්ථාවට සහ ආන්ඩුවට සම්පූර්නයෙන්ම පැහැදිලි කල බවත් බැංකු විසින් අවධාරනය කර තිබේ.

ඉහල ඉන්ධන මිල සම්බන්ධ සෝලිය සහ මහජනයා තුල පවතින පුලුල් විරුද්ධත්වය ගසාකෑමට උත්සාහ කරමින් විරුද්ධ පක්ෂ දේශපාලනඥයන් සහ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු රාජපක්ෂ ආන්ඩුව යටතේ ඛනිජ තෙල් සංස්ථාව පවත්වාගෙන යාමේදී අක්‍රමිකතා සහ දූෂන සිදු වී ඇති බවට චෝදනා කරමින් උපරිමාධිකරනයේ මූලික අයිතිවාසිකම් පිලිබඳ පෙත්සමක් ගොනු කලහ. හෙජින් ගිවිසුම බල රහිත කිරීම සහ ඉන්ධන මිල ලෝක ඉන්ධන මිල සමග සමානුපාතික කිරීම පෙත්සම්කරුවෝ ඉල්ලා සිටියහ.

හෙජින් ගිවිසුම යටතේ තෙල් සංස්ථාව විසින් බැංකුවලට කරන ගෙවීම් තාවකාලිකව නතර කල යුතු බවට උසාවිය නොවැම්බර් 28 අතුරු නියෝගයක් පැනවීය. පෙත්සම ඉදිරිපත් කරන විටත් තෙල් සංස්ථාව ඩොලර් මිලියන 32ක් ගෙවා තිබූ අතර තවත් ඩොලර් මිලියන 46 වාරිකයක් ගෙවීමට ආසන්නව තිබුනි. එක් තක්සේරුවකට අනුව රාජ්‍ය සංස්ථාව ඊලඟ මැයි මාසය වන විට ඩොලර් බිලියනයක් දක්වා ගෙවිය යුතු විය.

තෙල් සංස්ථාවේ සභාපති ද මෙල් සහ ඛනිජ තෙල් ඇමති ඒ.එච්.එම්. ෆවුසි තනතුරුවලින් පහකල යුතු බවට විනිශ්චයකාරවරු නියෝග කලහ. රාජපක්ෂ විසින් පත්කල ඔහුගේ සගයෙකු වන ද මෙල් ගේ සේවය අත්හිටවූ නමුත් ඇමතිවරයා ඉවත් කිරීමේ උසාවි නියෝගය ගැන ජනාධිපති තැකීමක් නො කලේ ය.

පුද්ගලික දූෂනවල සම්බන්ධයක් තිබුනත් නැතත් හෙජින් ගිවිසුම රාජපක්ෂගේ පාලන ක්‍රමවේදය සම්බන්ධ සලකුනකි. ඉහල යමින් තිබූ තෙල් මිල මගින් ආන්ඩුවට ප්‍රධාන ප්‍රශ්නයක් නිර්මානය කර තිබුනි. මිල ඉහල යෑම දිගටම සිදු වුයේ නම් මුදල් ඇමති ද වන රාජපක්ෂ ඉහල නගින ප්‍රවාහන ගාස්තුවලට එරෙහිව කෝපාවිශ්ට විරෝධතා පැන නැගීමේ අන්තරායට මුහුන දුන්නේ ය. සහනාධාර වැඩිපුර දීම මගින් තෙල් මිල පහත හෙලුවා නම්, දැනටම දැවැන්ත මිලිටරි වියදම් නිසා බර පැටවී ඇති ආන්ඩුවේ වියදම් පිලිබඳ අර්බුදයක් මතු කෙරෙනු ඇත. එවන් ඉහල අන්තරායක් තිබියදී ම හෙජින් ගිවිසුම ගැලවුම් මාර්ගය ලෙස දුටු බව නිසැක ය.

ගිවිසුම සුදුසු බලධාරීන්ගේ නිසි පිරික්සීමකින් තොරව රාජපක්ෂ සහ ඔහුගේ සමීපතම සගයන් විසින් හදිසියේ ඇති කර ගත් එකක් බව පෙනෙන්නට තිබේ: ගිවිසුම තෙල් සංස්ථාවේ අධ්‍යක්ෂ මන්ඩලයට ඉදිරිපත් නොකල අතර අමාත්‍ය මන්ඩලය විසින් අවසන් කෙටුම්පතට අනුමැතිය දුන්නේ දැයි මෙම අවස්ථාවේදී පැහැදිලි නැත. එක් අර්බුයකින් තවත් අර්බුදයකට ලුහුටා යමින් ආන්ඩුවේ මුල්‍ය වියදම් පියවා ගැනීමට ක්ෂනිකව වාසිදායක විය හැකි යැයි පෙනෙන දෙයක් කිසිදු වගවිභාගයක් නැතිව ම රාජපක්ෂ කඩිමුඩියේ ක්‍රියාවට දමනු ලබයි.

ආන්ඩුවේ අයවැයෙන් කොපමන ප්‍රමානයක් ඉන්ධන බදු මගින් ආවරනය කෙරුනේ දැයි පසුගිය සතියේ උසාවි නඩු විභාගයෙදී එලිදරව් විය. තෙල් බැරලයක මිල ඩොලර් 56.05 ප්‍රමිති පදනම මත පෙට්‍රල් මිල තීරනය කල යුතු බවත් ආන්ඩුවේ බද්ද සියයට සියය නොඉක්මා විය යුතු බවටත් විනිශ්චයකරුවන් මහා භාන්ඩාගාරයට උපදෙස් දුන්නේ ය.

මහා භාන්ඩාගාරය අධිකරනයට ඉදිරිපත් කල තොරතුරු අනුව පැහැදිලි වූයේ එම රුපියල් 122 බව වාර්තාවන පෙට්‍රල් ලීටරයක මිල යටතේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දැරිය යුතු සම්පූර්න වියදම සහ ලැබිය යුතු ලාභය ඇතුලත් වූ විට තෙල් ලීටරයක මිල රුපියල් 48.77 විය යුතු බවය. ඉතිරි රුපියල් 73.23 වෙන වෙනම බදු හතක් යටතේ ආන්ඩුවේ මුදල් පෙට්ටගම්වලට යයි.

විධායකයේ නියෝග අනුව පනවා ඇති සියලුම බදු "අසාධාරන" සහ "හිතුවක්කාර" වන අතර මහජනතාවට ඇති "නීතියේ සමාන ආරක්ෂාව" ප්‍රතික්ෂේප කිරීමක් හා "අධික මිල ගනන් ජීවන වියදම කෙරෙහි බරපතල බලපෑමක්" ඇති කරන බව උපරමාධිකරනය සිය තීන්දුවේ ප්‍රකාශ කලේ ය. බදු ක්‍රම සංඛ්‍යාව හතේ සිට තුන දක්වා අඩු කිරීමේ මහා භාන්ඩාගාර සූත්‍රය විනිශ්චයකාරවරු පිලිගත් අතර පෙට්‍රල් ලීටරයක මිල දෙසැම්බර් 17 මධ්‍යම රාත්‍රියේ සිට රුපියල් 100 දක්වා අඩුකරන ලෙස නියෝග කලේ ය. උපරිමාධිකරනය එල්ටීටීඊයට එරෙහි ආන්ඩුවේ වාර්ගික යුද්ධයට වල කපන බවට ව්‍යාජ චෝදනා කිරීමක් සහිතව ආන්ඩුවේ කටුක ප්‍රතිචාරය උසාවි නියෝගයට විරුද්ධව එල්ල විය. ඔහුගේ ආන්ඩුව "මිල සූත්‍ර උගුලෙහි නොවැටෙන බව" ප්‍රකාශ කරමින් උසාවි තීරනය පූර්ව භංග කිරීමට ඊට සතියකට පෙර රාජපක්ෂ උත්සාහ කලේය. පෙත්සම් කරුවන් ගැන සඳහන් කරමින් ඔහු මෙසේ කීවේ ය. "බදු අඩු කර ගැනීම සඳහා ඔවුන් උසාවියට යනවා. මේ ආන්ඩුව වට්ටන්න හදන එල්ටීටීඊ එකයි ඔවුනුයි අතර තිබෙන වෙනස කුමක් ද?"

රාජපක්ෂ පරිපාලනයට එරෙහිව උපරිමාධිකරනය මෑතදී ඍජුව ම නියෝග ගනනාවක් නිකුත් කොට තිබේ. වඩාත්ම වැදගත් උසාවි නියෝගය වූයේ ව්‍යවස්ථාවෙන් ඉඩ සලසා ඇති පරිදි පොලිස් පරිපාලනය, රාජ්‍ය සේවය, අධිකරනය සහ මැතිවරන අධීක්ෂනය කිරීමේ කොමිෂන් ඇතුලුව පලල් පරාසයක පත් කිරීම් සොයා බලන ව්‍යවස්ථා මන්ඩලයක් ස්ථාපිත කිරීමට ආන්ඩුව යොමු කිරීම ය. ව්‍යවස්ථා මන්ඩලයක් පත් කිරීම රාජපක්ෂ විසින් වසර තුනකට වඩා වලකනු ලැබ ඇති අතර රාජ්‍ය නිලධරය පුරාම ප්‍රධාන නිලතලවලට ඔහුගේ සමීපතම සගයන් පත් කිරීමට ඔහුට තිබෙන පුලුල් ජනාධිපති බලතල යොදා ගත්තේ ය. සමාන්‍ය වැඩ කරන ජනාව ආරක්ෂා කිරීමේ සහ රාජපක්ෂ ආන්ඩුවේ හිතුවක්කාර බලතල පාලනය කිරීමක් ලෙස කොලඹ ප්‍රවෘත්ති ආයතනවල විවිධ අටුවාකරුවන් විසින් උසාවි තීන්දුව හුවා දක්වා ඇත. පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ කතුවැකියක් උසාවි තීන්දු මිලිටරි නායක ජනාධිපති පර්වේස් මුසාරෆ් බලයෙන් පහ කිරීමේ දී පකිස්ථාන අධිකරනයේ සහ නීති වෘත්තියේ භූමිකාවට සමාන කර තිබුනි.

එහෙත්, උපරිමාධිකරනය වැඩ කරන ජනතාවගේ ජීවනතත්වයන් සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමට ක්‍රියා නොකරයි. ඊට විපරිතව උසාවි තීන්දු මගින් පිලිබිඹු කරන්නේ, රාජපක්ෂ ඔහුගේ අතේ බලය සංකේන්ද්‍රනය කරමින් සිටීම සහ විධායක බලතල යොදා ගනිමින් පාර්ලිමේන්තුවේ අධීක්ෂනයෙන් තොරව හිතුවක්කාර තීන්දු ගැනීම කෙරෙහි පාලක ප්‍රභූවේ කොටසක උත්සුකතාවයන් ය. සියලුම ප්‍රධාන දේශපාලන පක්ෂ යලි ආරම්භ කර ඇති වාර්ගික යුද්ධයට සහාය දෙන අතර රාජපක්ෂ

වඩවඩා අත්තනෝමතික පාලනයක් කරා තල්ලුවීම වාර්ගික යුද්ධයේ සමාජ බලපෑම කෙරෙහි සහ ගැඹුරුවන ගෝලීය මන්දාවධමනය කෙරෙහි බලගතු විරුද්ධත්වයක් අවුලුවාලනු ඇතැයි බියක් ඇත. ජනවාරි 5 දක්වා අධිකරනය වර්ෂාවසාන නිවාඩුව භුක්ති විඳියි. ආන්ඩුව උපරිමාධිකරනය විසින් දෙන ලද තීන්දුව පිලිගැනීම ප්‍රතික්ෂේප කලහොත් ගැටුම සම්පූර්න ව්‍යවස්ථා අර්බුදයක් බවට පරිවර්තනය වනු ඇත.

© www.wsws.org